# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2353/73 - 2023 ඔක්තෝබර් මස 13 වැනි සිකුරාදා - **2023.10.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : තිප්‍රාලේ/1/8/3/59 අත්.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/11/2017/UDA/306.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත සඳහන් ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

හීන් ඇල මාර්ගය දීර්ඝ කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (කොළඹ මහ නගර සභා සීමාව තුළ ගෝතමීපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ) බොරැල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 520618 හා 2023.07.31 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 1 හා 2 වශයෙන් පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0593 ක් පමණ වූ ඉඩම් කැබැලිවල විස්තර පහත පරිදි වේ :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: වරිපනම් අංකය 228 ලේක් ඩ්‍රයිව්; වර්තමාන ඉඩම් පරිහරණය : ගෙවත්ත; හිමිකම් කියන අය : රජය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0509

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: වරිපනම් අංකය 228 ලේක් ඩ්‍රයිව්; වර්තමාන ඉඩම් පරිහරණය : විවෘත මුඩු බිම; හිමිකම් කියන අය : රජය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0084

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 නොවැම්බර් මස 23 වැනි දින පෙ.ව. 10.00ට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023 නොවැම්බර් මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්වල වන්දි ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ප්‍රියන්තා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2023 ඔක්තෝබර් මස 09 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0163

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : NYGM/LAN/7/50.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2014/WS/227.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත සඳහන් ඉඩම/ පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු පිටිගල ගමේ අ.ග.පි. 592 දරන පිඹුරේ අතිරේක අංක 35 හි පත්‍ර අංක 36න් දක්වා ඇති පහත විස්තර වන ඉඩම් කැබැල්ල සම්බන්ධයෙනි.

**කැබලි අංක 1350**
ඉඩමේ නම: හල්ගහඹිවිට; වත්මන් ඉඩම් පරිහරණය : රජය; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය : ඩබ්. ඩී. එම්. ප්‍රදීප් කුමාර තොටුපල පාර, පිටිගල; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0089

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.11.14 දින පෙ.ව. 10.00ට නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023 නොවැම්බර් මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ටී. ජී. එස්. සජීවනී,
**අත්කර ගැනීමේ නිලධාරී,**
ප්‍රාදේශීය ලේකම්,
නියාගම.

2023 ඔක්තෝබර් මස 11 වැනි දින,
නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0164